(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 12(7).]

# පාර්ලිමේන්තුවේ අංක 12 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 ඔක්තෝබර් මස 25 වැනි සෙනසුරාදා**

## 2014 නොවැම්බර් මස 03 වැනි සඳුදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## 2014 නොවැම්බර් මස 17 වැනි සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2757/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ මතුගම අධ්‍යාපන කොට්ඨාසයේ මේ වනවිට වසා දමා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) වසා දමා ඇති පාසල්වල භෞතික සම්පත්වල වටිනාකම කොපමණද;

(iv) එම පාසල්වල භෞතික සම්පත් මහජන මුදලින් ඉදිකර ඇති බැවින් ඒවා ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදාගැනීමට වැඩ පිළිවෙළක් සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3556/'13

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2004 වර්ෂයේ සිට අද දක්වා සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති රජයට අයත් සමාගම් සංඛ්‍යාව වාර්ෂික පදනමින් කොපමණද;

(ii) ඒවා සංස්ථාගත කිරීමට හේතුව, එක් එක් සමාගමේ බලයලත් සහ ගෙවන ලද ප්‍රාග්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සංස්ථාගත කරන ලද දිනයේ සිට මේ දක්වා රජයට අයත් සමාගම් ලැබූ ලාභාංශ කොපමණද;

(iv) මෙම සමාගම්වල විගණන නිලධාරීන්ගේ නම් කවරේද;

(v) ඔවුන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) ඉදිරියට පැමිණ තිබේද;

(vi) එසේ නම්, ඔවුන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) ඉදිරියට පැමිණියේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4399/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික් වන නිලධාරී කොට්ඨාස කාර්යාලය මගින් පාලනය වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පයිනස් සහ වෙනත් වගාවන් වගා කර ඇති බව දන්නේද;

(iii) එලෙස වගා කර ඇති වනාන්තර බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වගා කර ඇති ඉඩම් අනවසරයෙන් පුද්ගලයින් විසින් අල්ලාගෙන ඇති බවත්;

(ii) එම ඉඩම්වලින් කොටසක් රජය මගින් මහජනතාව සඳහා ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(iii) හි සඳහන් වනාන්තර භූමි ප්‍රදේශයෙන් පුද්ගලයින් අනවසරයෙන් පදිංචි වී ඇති ඉඩම් ප්‍රමාණය හා රජය මගින් මහජනතාවට ලබාදී ඇති බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත වනාන්තර භූමි ඉහත පරිදි මිනිසාගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නිසා ජල පෝෂක ප්‍රදේශ විනාශ වී යන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, මෙම තත්ත්වය වැළැක්වීම සඳහා කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4423/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානදුර පිහිනුම් තටාකයේ පරිපාලනය සිදු කරනු ලබන පාර්ශ්වය කවරේද;

(ii) එම පිහිනුම් තටාකය ඉදිකරනු ලැබූ වර්ෂය කවරේද;

(iii) එම පිහිනුම් තටාකය ඉදිකිරීමට අදාළ ගිණුම් වාර්තා ඉදිරිපත් කරන්නේද;

(iv) දැනට මෙම පිහිනුම් තටාකයේ 'පිහිනුම් පුහුණුකරු' තනතුර දරන පුද්ගලයා කවුරුන්ද;

(v) එම පුද්ගලයාගේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4614/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ වත්මන් ඒක පුද්ගල ආදායම සම්මත අයුරින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රටේ ආදායම් උපයනු ලබන පුද්ගලයින් අතර සිටින සමස්ත රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් වත්මන් ඒක පුද්ගල ආදායමට සමාන හෝ එයට වැඩි වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එය සමස්ත රාජ්‍ය සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4681/’13

ගරු පී. හැරිසන් මහතා,— උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් පසුගිය වර්ෂ පහ තුළදී වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම සත්වෝද්‍යානයේ සිටින සත්ව වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එහි භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළු (CHOGM) ගම්මානය සඳහා දෙහිවල සත්වෝද්‍යානයෙන් ගෙන යනු ලැබූ සතුන් එහිදී මිය ගොස් ඇත්නම්, එසේ මිය ගොස් ඇත්තේ දේශීය සතුන්ද; නැතහොත් විදේශීය සතුන්ද;

(ii) එම ගම්මානයට ගෙන්වනු ලැබූ කුරුලු විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානය වෙත ගෙන එනු ලැබූ සතුන් හෝ පක්ෂීන් අතරින් ආබාධිත තත්ත්වයට පත් වූ සංඛ්‍යාව කොපමණද;

(iv) එම සතුන් වර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5179/’14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන මැතිවරණ පැවැත්වීමට අදාළව එක් එක් පළාත් පාලන ආයතනයේ සිටිය යුතු නියෝජිත සංඛ්‍යාව තවමත් ප්‍රකාශයට පත් නොකිරීමට හේතුව කවරේද;

(ii) එක් එක් පළාත් පාලන ආයතනය සඳහා නියෝජිතයන් පත් වන බල ප්‍රදේශ තවමත් ප්‍රකාශයට පත් නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5200/’14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හික්කඩුව, බද්දේගම, නිල්හේන (B153) මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ භාරකාරත්වය මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින්නේද;

(ii) එම ව්‍යාපෘතියට අදාළව පවරා ගන්නා දේපල වෙනුවෙන් ගෙවීම් කිරීමේ ක්‍රමවේදය ඇතුළත් ප්‍රතිස්ථාපනය කිරීමේ දළ සැලැස්ම ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මහජනතාවට ප්‍රදර්ශනය කළ දිනය කවරේද;

(iii) එම දිනය වන විට ඉඩම් පවරා ගැනීමට අදාළව සිදුකර තිබූ කටයුතු කවරේද;

(iv) ඉහත (ii) මගින් විමසන දිනයට ඉඩම් පවරා ගැනීමට අදාළව ගෙවීම් කර තිබූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) ගෙවීම් කළ එම ඉඩම් ප්‍රමාණය, පවරා ගත යුතු මුළු ඉඩම් ප්‍රමාණයෙන් කවර ප්‍රතිශතයක්ද;

(vi) යාවත්කාලීන කරන ලද ප්‍රතිස්ථාපනය කිරීමේ සැලසුම මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියේ පළ කළ දිනය කවරේද;

(vii) වෙබ් අඩවියේ පළ කිරීමට අමතරව, එම ඉඩම් පවරා ගැනීමට අදාළ පාර්ශවයන් හා පුද්ගලයින් සෘජු ලෙස දැනුවත් කළේද;

(viii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය සඳහා දේපල පවරා ගැනීම් වෙනුවෙන් ගෙවීම් සිදුකිරීමේදී අක්‍රමිකතාවයක් සිදුවී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2758/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුර බණ්ඩාරනායක අරමුදලෙන් වතුපිටිවල රෝහලේ ඉදිකළ ලේ බැංකුව සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම ලේ බැංකුව විවෘත කිරීමෙන් පසු නැවත වසා දමා ඇති බව පිළිගන්නේද;

(iii) වතුපිටිවල රෝහලට පැමිණෙන රෝගීන්ගේ ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි සකසා එම ලේ බැංකුව නැවත ජනතා අයිතියට පවරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3557/'13

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2006 සිට අද දක්වා,

(i) සමාගම් පනත යටතේ හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ ලියාපදිංචි කර ඇති රජයට අයත් සංස්ථා, අධිකාරී, දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සමාගම් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා යම් පුද්ගලයකුට හෝ යම් ආයතනයකට පවරා, විකුණා හෝ භාරදී තිබේද;

(ii) එසේ නම්, ඉහත සඳහන් වෙනස්වීම්වලට විෂය වී ඇති රාජ්‍ය ආයතනවල නම් හා අදාළ වෙනස්කම් සිදු කරන ලද දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ වෙනස් කිරීම් සිදුකිරීමේ අරමුණ කවරේද;

(ii) එම වෙනස් කිරීම් සිදුකරන ලද්දේ ටෙන්ඩර් තෝරාගැනීම් හෝ ඉල්ලීමකින් තොර යෝජනා හරහාද;

(iii) එය ලබා දුන් වටිනාකම හා එහිදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

(iv) භාරදුන් දින සිට මේ දක්වා ලැබූ ආදායම හෝ ලාභාංශ වාර්ෂික පදනමින් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4401/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිවිරෝධී ලෙස වනාන්තරවලින් අල්ලා ගන්නා ලද අලි-ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා සහන කාලයක් ලබා දී තිබේද;

(ii) නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටින අලි - ඇතුන් ලියාපදිංචි කිරීම සඳහා රුපියල් ලක්ෂ 10ක බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට කටයුතු කරන්නේද;

(iii) එලෙස ලියාපදිංචි කිරීමේ මුවාවෙන් අලි-ඇතුන් වෙළඳාම් කිරීමක් සිදුවන බවට පරිසරවේදීන් චෝදනා කරන බව දන්නේද;

(iv) ඉහත (iii)හි සඳහන් පරිදි කටයුතු කිරීම 2009 අංක 22 දරන පනතින් අවසන් වරට සංශෝධිත, 1937 අංක 02 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කිරීමක් බව පිළිගන්නේද;

(v) එසේ නම්, එවැනි ක්‍රියා වැළැක්වීමට කටයුතු කරන්නේද;

(vi) එලෙස කටයුතු කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4622/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ තාප බලාගාරය, හම්බන්තොට වරාය, හම්බන්තොට ගුවන් තොටුපල, හම්බන්තොට (සූරියවැව) ක්‍රිකට් ක්‍රීඩාංගනය, ත්‍රිකුණාමලය බලාගාරය සහ සාම්පූර් බලාගාරය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදු කරනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටෙන්ඩර් නොකැඳවා ඉහත ව්‍යාපෘතිවලට අදාළ ඉදිකිරීම් විදේශීය පෞද්ගලික ආයතනවලට භාර දීමේ දී විශාල කොමිස් මුදල් ලබා ගැනීම් සිදු වී තිබේද;

(ii) චීන ණය යටතේ ක්‍රියාත්මක වන ඉහත සියලු ව්‍යාපෘතිවලට අදාළ ණය සම්බන්ධයෙන් ගිවිස ගෙන ඇති සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5103/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් සිසුන්ගේ පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබා දීමක් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, 2013 වර්ෂයේදී හා 2014 වර්ෂයේ මේ දක්වා ලබා දී ඇති එම ශිෂ්‍යත්ව සංඛ්‍යාව කොපමණද;

(iii) එම ශිෂ්‍යත්වලාභී සිසුවකුට මාසිකව හිමි වන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ශිෂ්‍යත්ව සඳහා අයදුම් කළ යුතු ආකාරය කවරේද;

(ii) එම ශිෂ්‍යත්ව ලබා දීම සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) එම සිසුන් අතට ශිෂ්‍යත්ව මුදල් මාසිකව ලබාදීම සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5227/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014.05.12 දිනට යෙදී තිබූ ''පවුල් සෞඛ්‍ය සේවා දිනය'' වෙනුවෙන් ජනාධිපතිවරයාට තිළිණයක් ප්‍රදානය කිරීම සඳහා රජයේ පවුල් සෞඛ්‍ය සේවා සංගමය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හරහා එහි සේවයේ නියුතු පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගෙන් රු. 5000ක මුදලක් එකතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායෙහි සේවයේ නියුතු සමස්ත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් පරිදි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගෙන් අය කර ඇති මුළු මුදල කොපමණද;

(iv) එම මුදලින් ජනාධිපතිවරයාට ලබා දී ඇති ත්‍යාගය කවරක්ද;

(v) මෙවැනි තිළිණයක් ලබා දීමට රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී සංගමයේ නිලධාරිනියන් කටයුතු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රජයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී සංගමයේ සභාපතිනියගේ නම කවරේද;

(ii) ඇය සතු සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5263/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෙලිප්පිලෙයි රෝහලේ සේවය කරන වෛද්‍යවරුන්ට සහ හෙදියන්ට නේවාසික පහසුකම් නොමැති බවත්;

(ii) රෝහලේ විදුලි පංකා ක්‍රියා විරහිත වීම් වැනි බොහෝ අඩුපාඩු ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) තෙල්ලිප්පලෙයි රෝහලේ පවතින සියලු අඩුපාඩු සපුරාලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5441/'14

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ, අලුවිහාරේ, ශ්‍රී සරණංකර පාර හා එගොඩගම පාර අතර අතුරු මාර්ගයේ, තාඹරවල්ලිය කන්දේ සිට ගලා බසින ඇළ හරහා පාලමක් ඉදි කර ඇති බවත්;

(ii) පාලමේ එක් පසකින් මාර්ගයක් තිබුණද, අනෙක් පසින් යාමට හෝ ඒමට මාර්ගයක් සකස් කර නොමැති බවත්;

(iii) එම පාලම ඉදිකිරීම සම්බන්ධව කිසිදු දැන්වීමක් / පුවරුවක් සවි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පාලමේ,

(i) ඉදිකිරීමට අදාළ සැලසුම් සකස් කළ ආයතන හෝ පුද්ගලයෝ කවුරුන්ද;

(ii) ඉදිකිරීම් කවුරුන් විසින් සිදු කළේද;

(iii) වැඩ ආරම්භ කළ දිනය සහ වැඩ අවසන් කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිග හා පළල කොපමණද;

(v) ඉදිකිරීම් සඳහා වැය කළ මුදල කොපමණද;

(vi) ඉදිකිරීම් වෙනුවෙන් මුල්‍යා ප්‍රතිපාදන සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී පාලම ඉදිකිරීමෙන් ජනතාවට අත් වන ප්‍රතිලාභ කවරේද;

(ii) එම පාලමට සම්බන්ධ මාර්ගයේ ඉදිරි කොටස සකස් කිරීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා කොපමණ කාලයක් ගතවේද;

(iv) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2759/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අගලවත්ත අඩවි වන නිලධාරි කාර්යාලයට අයත්, 'මෝල්කාව නිල නිවාසය' නඩත්තු නොකොට අතහැර දමා තිබීමට හේතු කවරේද;

(ii) එම නිල නිවාසය නිසි ලෙස අලුත්වැඩියාකොට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ලබා දීම තුළින් එම ප්‍රදේශයේ සිදුවන මහා පරිමාණ අනවසර දැව කැපීම් සහ ප්‍රවාහන කටයුතු අවමකර ගත හැකි බව පිළිගන්නේද;

(iii) අගලවත්ත ප්‍රදේශයේ වනාන්තර අනවසර දැව කපන්නන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා නිසි පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3558/'13

ගරු රවී කරුණානායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත් කෙටුම්පත ක්‍රියාත්මක කිරීමේ අරමුණ කවරේද;

(ii) 2012 පෙබරවාරි මස සිට මේ දක්වා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව, ඒවායේ නම්, ක්‍රියාත්මක කරන ලද රටවල්, ආයෝජනයේ වටිනාකම, සැපයීමට අපේක්ෂිත නිෂ්පාදන හෝ සේවාවන් හා යෙදවෙන සේවක සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත සඳහන් කාල සීමාව සඳහා පිරිවැටුම සහ එක් එක් ආයෝජකයා විසින් ගෙවිය යුතු තීරු බදු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) උක්ත කාල සීමාව තුළ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම්වල මුළු වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් පහත කාරණා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත, 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත, 2002 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත, 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත, 2002 අංක 16 දරන හර බදු පනත හා රේගු ආඥාපනත (235 වැනි අධිකාරය) හා දැනට ක්‍රියාත්මක වෙනත් නීතියක් හෝ පනතක් යටතේ ලබා දී ඇති බදු නිදහස් කිරීම් ප්‍රමාණය ඉහත සඳහන් කරන ලද කාල සීමාවට අදාළව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4402/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම කාර්ය මණ්ඩලවල පවතින්නේ අතිරික්තයක්ද; නැතහොත්, ඌනතාවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම අධ්‍යයන කාර්ය මණ්ඩලවල එක් එක් තනතුර සඳහා හිමි වැටුප් හා දීමනා කවරේදැයි වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5228/'14

ගරු තිස්ස අත්තනායක මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ මුල් කාර්තුව තුළ ශ්‍රී ලංකාවට ලැබී ඇති විදේශ ආයෝජන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයෝජන සඳහා යොදවා ඇති මුදල් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ආයෝජන සිදු වූ ක්ෂේත්‍රයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ආයෝජන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම විදේශ ආයෝජන හරහා මෙරටට ලැබෙතැයි අපේක්ෂිත රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) විදේශ ආයෝජකයින් දිරි ගැන්වීම සඳහා මේ වන විට ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5309/'14

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ වරාය නගරය (Colombo Port City) ව්‍යාපෘතිය මගින් ගොඩකිරීමට අපේක්ෂිත මුහුදු ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා මුහුද ගොඩකිරීම තුළින් ඇති විය හැකි පාරිසරික වෙනස්කම් පිළිබඳව අවධානය යොමු කර තිබේද;

(iii) එම ව්‍යාපෘතිය මගින් බටහිර මුහුදු වෙරළේ, වාද්දුව සිට හලාවත දක්වා ප්‍රදේශයට පාරිසරික බලපෑමක් සිදුවන බව දන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොළඹ වරාය නගරය ව්‍යාපෘතියට අදාළව සිදුවිය හැකි පාරිසරික හානි පිළිබඳව වාර්තාවක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5348/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඹල් කර්මාන්තයෙන් යැපෙන පිරිස් ජීවත් වන ගම්මාන කවරේද;

(ii) එම කර්මාන්තයෙන් යැපෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුඹල් කර්මාන්තයේ යෙදෙන ජනතාව වෙසෙන ගම්මානවලින්ම කුඹල් කර්මාන්තය සඳහා අවශ්‍ය මැටි සපයා ගනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එම කර්මාන්තය සඳහා අවශ්‍ය මැටි මිලදී ගනු ලබන්නේද;

(iii) මැටි ආශ්‍රිත නිෂ්පාදන වෙළඳපොළ පිළිබඳ පවතින ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කුඹල් කර්මාන්තය, මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම සහ අවශ්‍ය මැටි සපයා ගැනීම ආදිය සඳහා රජයෙන් ලබාදෙන සහාය කවරේද;

(ii) මැටි භාණ්ඩ භාවිතය පිළිබඳව ජනතාව තුළ උනන්දුවක් ඇති කිරීමට රජයේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5415/'14

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ පුද්ගලයන් හෝ පුද්ගලික ආයතන හෝ රජය මගින් පවත්වාගෙන යන මහජන වැසිකිළි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

යන්න පළාත් පාලන ආයතන මට්ටමින් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මහජන වැසිකිළි පුද්ගලයන් හෝ පුද්ගලික ආයතන සඳහා ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) ඒවා බදු දීමෙන් වර්ෂ 2011 - 2013 දක්වා ලැබූ ආදායම කොපමණද;

(iii) මහජන වැසිකිළි භාවිතයේදී එක් වරකට අය කරන මුදල කොපමණද;

(iv) එම මුදල තීරණය කිරීමේ නිර්ණායක කවරේද;

(v) නිර්ණායක සකස් කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහජන වැසිකිළි නඩත්තු කරන ආයතනය සහ අදාළ වැය ශීර්ෂය කවරේද;

(ii) එම වැසිකිළිවලට සිදුවන අලාභහානි ඒවා ලබා ගෙන ඇති පාර්ශ්වයන්ගෙන් පියවා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද:

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මහජන වැසිකිළි පුද්ගලික සමාගම් වෙත පවරාදීමේ අරමුණ කවරේද;

(ii) රජය විසින් එම ස්ථාන පවත්වාගෙන යාමේ වගකීම නොදරන්නේ මන්ද;

(iii) රජය විසින් මහජන වැසිකිළි පවත්වාගෙන යාමේ හා නඩත්තු කිරීමේ ඉදිරි සැලසුමක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5471/'14

ගරු හුනෛයිස් ෆාරුක් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ තෙන්ඩ්‍රල් සේවයේ,

(i) අධ්‍යක්ෂ සහ පාලක තනතුරු දරන නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම තනතුරුවල වැඩ බලන නිලධාරීන්ගේ නම් සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) තෙන්ඩ්‍රල් සේවයේ සිටින ස්ථිර නිවේදකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් නිවේදකයාගේ නම හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හා (අ)(ii) හි සඳහන් තැනැත්තන් හට තනතුරු ලබා දී ඇත්තේ නියමිත පටිපාටියට අනුකූලවද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 නොවැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2760/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල රජයේ පාසල්වල පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම දෙමළ ගුරු පුරප්පාඩු පිරවීමට ඉන්දියාවෙන් දෙමළ ගුරුවරුන් ගෙන්වීමේ සැලැස්මක් තිබේද;

(iii) ඉන්දියාවෙන් දෙමළ ගුරුවරුන් නොගෙන්වා, ශ්‍රී ලාංකික රැකියා විරහිත දෙමළ උපාධිධාරීන්ගෙන් අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3559/'13

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සහ 2013 වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය යටතේ ඇති අන් කවර හෝ ආයතනයකට / කාර්යාලයකට විශේෂඥ උපදේශකවරයකු, අනුශාසකවරයකු හෝ වෙනත් එබඳු නිලධාරියකු පත්කරනු ලැබ තිබේද;

(ii) එසේ නම්, එසේ පත් කරන ලද පත්වීම් ලාභීන්ගේ නම් සහ ඔවුන් පත් කරන ලද දිනයන් කවරේද;

(iii) ඔවුන් පත් කිරීමේ පරමාර්ථය කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් මාසයකට වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉහත (අ)(i)හි ආකාරයේ පත්කිරීම් කිසිවක් හෝ සිදු කොට තිබේද;

(ii) මේ වන විට එම පත්වීම් ක්‍රියාත්මකව පවතීද;

(iii) එසේ නම්, ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ, ඔවුන් පත් කිරීම සඳහා සලකා බලන ලද වෙනත් යම් නිර්ණායකයන් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4404/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා කාලසීමාව තුළ රජයේ රෝහල්වල භාවිතා කර ඇති සේලයින් ප්‍රමාණය කොපමණද;

(ii) එම කාලසීමාව තුළ පෞද්ගලික රෝහල්වල සහ වෙනත් ආයතනවල භාවිතා කරන ලද සේලයින් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (i) හා (ii) හි සඳහන් සමස්ත සේලයින් ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලැබූ සේලයින් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සේලයින් නිෂ්පාදනය කරනු ලබන ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට සේලයින් ආනයනය කරන රටවල් සහ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද;

(ඇ) (i) මෙරට සේලයින් නිෂ්පාදනය දේශීය අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවේ නම්, වාර්ෂිකව ආනයනය කරනු ලබන සේලයින් ප්‍රමාණය කොපමණද;

(ii) 2013 වර්ෂයේදී සේලයින් ආනයනය සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය ආරම්භ කරන්නෙකු සඳහා රජය මගින් ලබා දිය හැකි සහන කවරේද;

(ii) එම සහන ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5264/'14

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නකල්ස් වන රක්ෂිත ප්‍රදේශයේ එනසාල් වගාවේ නිරතව සිටි හත්සියයකට ආසන්න පවුල් සංඛ්‍යාවක් එම ප්‍රදේශයෙන් ඉවත් කර ඇති බවත්;

(ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ නකල්ස් රක්ෂිතයේ එනසාල් වගා තහනම සහ ඉන්දියාවෙන් අධික ලෙස එනසාල් ආනයනය කිරීම අතර යම් සම්බන්ධයක් ඇති බවත්;

(iii) බ්‍රිතාන්‍ය පාලකයන්ගේ කාලයේ සිට අවුරුදු 75 කට අධික කාලයක් තිස්සේ පවුල් හයසියයකට අධික ප්‍රමාණයකගේ ආර්ථික සුබසිද්ධියට ඉවහල්ව තිබූ එම එනසාල් වගාව මේ වන විට සම්පූර්ණයෙන්ම විනාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එනසාල් වගාව සහ එම වගාකරුවන්ගේ සුබසිද්ධියට අදාළව කිසියම් පියවරක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5425/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ හා පෞද්ගලික ආයතනවලට සේවකයින් තාවකාලිකව බඳවා ගන්නා නීතිමය ප්‍රතිපත්ති රාමුව කවරේද;

(ii) ඔවුන් ස්ථිර කිරීමට පෙර කොපමණ කාලයක් තාවකාලික පදනම මත සේවය කළ යුතු වන්නේද;

(iii) තාවකාලිකව සේවය කරන කාලය තුළ ඔවුන්ට වැටුපට අමතරව වෙනත් ගෙවීමක් (මාසිකව හෝ රැකියා කාලය අවසන් වන විට) සිදු කිරීමට සේවාදායකයාට නෛතික බැඳීමක් තිබේද;

(iv) සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල ඔවුන් වෙත ලබා දෙන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5486/'14

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී නවසීලන්තයෙන් හෝ ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කළ ජර්සි වර්ගයේ කිරි දෙනුන් සංඛ්‍යාව;

(ii) ඊට වැය කළ මුදල ඇමරිකන් ඩොලර් වලින්;

(iii) එම දෙනුන් අතුරින් රෝගී වූ හා මියගිය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම දෙනුන් නුවරඑළිය ප්‍රදේශය හැර වෙනත් ප්‍රදේශවලට නොගැලපෙන බව එතුමා පිළිගන්නේද?

(ඇ) (i) එම දෙනුන් ආනයනය කළේ රජය මුදලින්ද; නැතහොත්, ණය ආධාරයක් යටතේද;

(ii) එම දෙනුන් බෙදා දුන් දිස්ත්‍රික්ක කවරේද;

(iii) දෙනුන් බෙදා දුන්නේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපළවලටද; නැතහොත්, පෞද්ගලික ගොවීන්ටද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිනම් ගොවිපොළවලට දෙනුන් ලබා දුන්නේද;

(v) එම දෙනුන්ගෙන් රෝගී වී හෝ මිය ගොස් ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) එසේ වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ වන විට නෙදර්ලන්තයෙන් කිරි දෙනුන් ඇනවුම් කර තිබේද;

(ii) එසේ නම්, ඊට වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) එය විදේශ මූලාශ්‍රවලින් ලබා ගන්නේද;

(iv) ලීටර් 30 - 40 කිරි ප්‍රමාණයක් ලබා දෙන, මෙරට දේශගුණයට ගැලපෙන ඉන්දියානු කිරි දෙනුන් සිටින බව දන්නේද;

(v) එසේ නම්, ඉන්දියාවෙන් කිරි දෙනුන් ආනයනය නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5597/'14

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.06.15 දින හා ආසන්න දිනවලදී අළුත්ගම, දර්ගා නගරය සහ වැලිපැන්න ප්‍රදේශවල ඇතිවූ කලහකාරී තත්ත්වය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන්නේ නම්, එහි වත්මන් තත්ත්වය කවරේද;

(ii) ඉහත සිදුවීම් ආරම්භ කිරීමට හා වර්ධනය කිරීමට අනුබල දුන් අය හා පහරදීම් සිදුකළ අය හඳුනාගෙන තිබේද;

(iii) ඔවුන් කවුරුන්ද;

(iv) ඔවුන්ට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හානියට පත්වූ නිවාස, ව්‍යාපාරික ආයතන හා වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එයට අදාළව ඇස්තමේන්තුගත හා ගෙවා ඇති වන්දිවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හානිවූ නිවාස සහ ව්‍යාපාරික ස්ථාන යථා තත්ත්වයට පත්කර තිබේද;

(iv) එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උක්ත සිදුවීමේදී,

(i) මිය ගිය සහ තුවාලවූ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් මරණයක් වෙනුවෙන් ගෙවූ වන්දි මුදල කොපමණද;

(iii) නොඑසේ නම්, ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) මරණයට පත් අයගේ ළඟම ඥාතියා වෙත එම වන්දිය ලබා දී තිබේද;

(v) අවතැන්වූ සිංහල හා මුස්ලිම් පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) වාර්තාකරණයේ යෙදී සිටියදී, ප්‍රහාරයට ලක් වූ ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(vii) හානියට පත් මාධ්‍ය උපකරණ වෙනුවෙන් වන්දි ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5657/'14

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛනයේ 'අ' පරිශිෂ්ටයේ සඳහන් ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළවන තනතුරුවලින් දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ලැයිස්තුවේ සඳහන් ඉහත ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවල පත්කිරීම් බලධරයා කවුරුන්ද;

(iii) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීමේ පටිපාටිය කවරේද;

(iv) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා මේ වන විට පත්කර ඇති ශ්‍රී.ලං.ප.සේ. නොවන නිලධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(v) 2012.07.02 සිට 2014.01.01 දින දක්වා වූ කාලය තුළ පුරප්පාඩු වී තිබූ ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරු පැවති ආයතන, එම තනතුරු නාම සහ තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා 2014 අගෝස්තු මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද, සුදුසුකම් සම්පූර්ණ කර තිබූ එක් එක් නිලධාරියාගේ නම, ඔවුන් ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියට පත් වූ දිනය, පශ්චාත් උපාධිය වලංගු දිනය, එම උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය හා එම උපාධියේ විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2761/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් සේවා නිලධාරීන් බඳවා ගැනීම සඳහා වූ විභාගයේ ඉල්ලුම්පතක් සඳහා එක් අපේක්ෂකයෙකුගෙන් අය කළ මුදල කොපමණද;

(ii) එම විභාගය පැවැත්වීමේ වගකීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට නොපවරා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට පැවරීමට හේතු කවරේද;

(iii) ඉහත විභාගය සඳහා ඉල්ලුම්පත් කැඳවා 2012 මැයි මස වන විටත්, මාස හතක් ඉක්මගොස් ඇති බැවින් වහාම විභාගය පවත්වා එහි ප්‍රතිඵල අනුව සුදුසුසුන් බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3560/'13

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සහ 2013 වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය යටතේ ඇති අන් කවර හෝ ආයතනයකට/කාර්යාලයකට විශේෂඥ උපදේශකවරයකු, අනුශාසකවරයකු හෝ වෙනත් එබඳු නිලධාරියකු පත්කරනු ලැබ තිබේද;

(ii) එසේ නම්, එසේ පත් කරන ලද පත්වීම්ලාභීන්ගේ නම් සහ ඔවුන් පත් කරන ලද දිනයන් කවරේද;

(iii) ඔවුන් පත් කිරීමේ පරමාර්ථය කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් මාසයකට වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉහත (අ) (i) හි ආකාරයේ පත් කිරීම් කවරක් හෝ සිදු කොට තිබේද;

(ii) මේ වන විට එම පත්වීම් ක්‍රියාත්මකව පවතීද;

(iii) එසේ නම්, ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ ඔවුන් පත් කිරීම සඳහා සලකා බලන ලද වෙනත් යම් නිර්ණායකයන් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4405/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවේ ගෘහස්ථ පොල් පරිභෝජනය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාල සීමාව තුළදී අපනයනය හා ආනයනය කරන ලද පොල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන අපනයනය ඉලක්ක කර ගත් පොල් ආශ්‍රිත නිෂ්පාදනයන් කවරේද;

(iii) එම එක් එක් නිෂ්පාදනයන්ගෙන් වාර්ෂිකව අපනයනය කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් කාල සීමාව තුළදී පොල් වතුර අපනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම පොල් වතුර අපනයනය කර ඇත්තේ පොල් වතුර ස්වරූපයෙන්ද; නැතහොත්, පොල් වතුර ආශ්‍රිත නිෂ්පාදනයන් වශයෙන්ද;

(iii) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කළ රටවල් කවරේද;

(iv) එම අපනයනයන්ගේ ප්‍රමාණය කොපමණද;

(v) පොල් වතුර හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම මගින් ලැබූ මුළු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ පොල් නිෂ්පාදනය ආරම්භ කරන්නෙකු සඳහා රජය මගින් ලබා දිය හැකි සහන කවරේද;

(ii) එම සහන ලබා ගැනීම සඳහා නිෂ්පාදකයෙකු විසින් අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5203/'14

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේදී එම ඉඩම්වල අගය තක්සේරු කළ පදනම කවරේද;

(ii) එහිදී හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පන්නිපිටිය සුහද මාවත, හිරිපිටිය, අංක 137හි පදිංචි ගාල්ලගේ රංෂි කාන්ති මහත්මියට අදාළ වන්දි ගෙවීම ඉහත පදනම යටතේ සිදු කරනු ලැබුවේද;

(iii) ඇයගේ ඉඩමෙන් අත්පත් කර ගත් ඉඩම් ප්‍රමාණය සහ ඒ වෙනුවෙන් ලබා දුන් වන්දි ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5416/'14

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කය තුළ පුද්ගලික අංශය හා රජය මගින් පවත්වාගෙන යන රථ ගාල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

යන්න පළාත් පාලන ආයතන මට්ටමින් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) රජයේ ඉඩම් රථ ගාල් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික අංශයට ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(ii) වර්ෂ 2011 - 2013 දක්වා එසේ බදු දීමෙන් ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථ ගාල්වල එක් එක් වාහන වර්ගය අනුව අය කරනු ලබන ගාස්තු කවරේද;

(iv) ගාස්තුව තීරණය කිරීමේ නිර්ණායක කවරේද;

(v) එම නිර්ණායක සකස් කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) රථ ගාල් නඩත්තු කරන ආයතනය සහ අදාළ වැය ශීර්ෂය කවරේද;

(ii) රථ ගාල්වලට සිදුවන අලාභහානි ඒවා ගෙන ඇති පාර්ශ්වයන්ගෙන් පියවා ගැනීමේ ක්‍රමවේදයක් තිබේද:

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) රජයේ ඉඩම් පුද්ගලික අංශය වෙත පවරාදීමේ අරමුණ කවරේද;

(ii) රජය විසින් රථ ගාල් පවත්වාගෙන යාමේ වගකීම නොදරන්නේ මන්ද;

(iii) රජය විසින් මහජන රථ ගාල් පවත්වාගෙනයාමේ ඉදිරි සැලසුමක් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5426/'14

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරායේ තෙල් ගබඩා සංකීර්ණයේ ආයතනික ව්‍යුහය කවරේද;

(ii) එය රජයට අයත් ආයතනයක්ද; නැතහොත්, රජයට අයත් සමාගමක්ද;

(iii) නොඑසේ නම්, එම ගබඩා සංකීර්ණය රජයට අයත් පෞද්ගලික ආයතනයක් ලෙස ක්‍රියාත්මකවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 ජූනි මස හෝ ඒ ආසන්න කාලයේදී හම්බන්තොට වරායේ තෙල් ගබඩා සංකීර්ණයට ගෙන එන ලද තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) එම තෙල් මෙරටට ගෙන ඒමට සම්බන්ධ පාර්ශ්ව කවරේද;

(iii) එම තෙල් ගෙන්වීම සඳහා අනුගමනය කළ ක්‍රියා පටිපාටිය කවරේද;

(iv) එම තෙල් භාර ගැනීමේදී ප්‍රමිතිය පරීක්ෂාවට ලක් කළේද;

(v) එසේ නම්, එම ප්‍රමිති පරීක්ෂාවල ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5442/'14

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල ගොඩනැගිලි හා ක්‍රීඩා පිටි වෙනත් බාහිර කටයුතු සඳහා ලබා දීමට අවසර දී තිබේද;

(ii) එසේ නම්, එම අවසර ලබා දීම සිදු කර ඇති චක්‍ර ලේඛය කවරේද;

(iii) එවැනි චක්‍ර ලේඛයක් නොමැති නම්, එසේ කිරීම සඳහා අවසර ලබා දී ඇති පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හෝ විදුහල්පතිවරු සිටින්නේද;

(iv) යම් බාහිර කටයුත්තක් සඳහා යම් පාසලක් හෝ එහි යම් කොටසක් ලබා දී ඇත්නම්, එය ලබා දීමේ අයිතිය තිබෙන ආයතනය හෝ පුද්ගලයා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5598/'14

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ, දොඩන්ගොඩ පිවිසුම් ස්ථානයෙන් මතුගම - කළුතර ප්‍රධාන මාර්ගයට පැමිණීමෙන් පසු, මතුගම දෙසට මීටර් 50 පමණ දුරින් පිහිටි පෞද්ගලික ඉඩමක කලක සිට මාර්ගය අවහිර වනසේ පස් කන්දක් තිබෙන බවත්,

(ii) එම පස් කන්ද, මාර්ගයේ ගමන් කරන රථ වාහනවලට හා පදිකයන්ට අවහිරයක් බවත්:

(iii) එම පස් කන්ද හේතුවෙන් එම ස්ථානයේ රිය අනතුරු සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ගය අවහිර වන සේ ඇති ඉහත පස් කන්ද ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 නොවැම්බර් මස 24 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2762/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 ජුනි මස පැවැත්වූ ආසියාතික කනිෂ්ඨ මලල ක්‍රීඩා උලෙළ සඳහා සුගතදාස ක්‍රීඩාංගනයේ නවීකරණ කොන්ත්‍රාත්තුව ලබා දුන් සමාගම ඊට අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණේද;

(ii) එම සමාගම, ධාවන පථයේ නවීකරණය නිසි ප්‍රමිතියෙන් යුතුව සිදුකර තිබේද;

(iii) එම සමාගම විසින් මීන් පෙර බෝගම්බර ක්‍රීඩාංගනයේ සිදුකළ ඉදිකිරීම් ප්‍රමිතියෙන් තොර බවට එල්ලවූ චෝදනාවල සත්‍යතාවයක් තිබේද;

(iv) සුගතදාස ක්‍රීඩාංගනයේ නවීකරණ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නිසි අධීක්ෂණයට ලක් කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3561/'13

ගරු රවි කරුණානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සහ 2013 වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය යටතේ ඇති අන් කවර හෝ ආයතනයකට / කාර්යාලයකට විශේෂඥ උපදේශකවරයකු, අනුශාසකවරයෙකු හෝ වෙනත් එබඳු නිලධාරියකු පත් කරනු ලැබ තිබේද;

(ii) එසේ නම්, එසේ පත් කරන ලද පත්වීම්ලාභීන්ගේ නම් සහ ඔවුන් පත් කරන ලද දිනයන් කවරේද;

(iii) ඔවුන් පත් කිරීමේ පරමාර්ථය කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් මාසයකට වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉහත (අ) (i) හි ආකාරයේ පත්කිරීම් කවරක් හෝ සිදුකොට තිබේද;

(ii) මේ වන විට එම පත්වීම් ක්‍රියාත්මකව පවතීද;

(iii) එසේ නම්, ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ ඔවුන් පත් කිරීම සඳහා සලකා බලන ලද වෙනත් යම් නිර්ණායකයන් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4406/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට එම කාර්ය මණ්ඩලවල පවතින්නේ අතිරික්තයක්ද; නැතහොත්, ඌනතාවක්ද;

(iii) එම අනධ්‍යයන කාර්ය මණ්ඩලවල එක් එක් තනතුර සඳහා හිමි වැටුප් සහ දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4426/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013 වර්ෂයේ අගෝස්තු මාසය වන විට උතුරු නැගෙනහිර ප්‍රදේශවල නැවත පදිංචි කළ,

(i) පවුල් සංඛ්‍යාව;

(ii) එම පවුල්වලට අයත් සාමාජික සංඛ්‍යාව;

(iii) ඒ අතර සිටින කාන්තාවන් සංඛ්‍යාව;

(iv) ළමුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත පරිදි නැවත පදිංචි කිරීම සිදු කළ නිවාස අතරින් වැසිකිළි පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4624/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාවිතයට නුසුදුසු ඉන්ධන ගෙන්වීම සම්බන්ධයෙන් චෝදනාලත් ආයතන දෙකකට නැවත ඉන්ධන ගෙන්වීමට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතනවල නම් කවරේද;

(iii) එම ආයතන දෙක තහනම් කරනු ලැබුවේ කුමන පදනමක් මතද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගුවන් යානා සඳහා භාවිතයට ආනයනය කරනු ලැබූ ඉන්ධන, භූමිතෙල් ලෙස භාවිතා කරනු ලබන්නේද;

(ii) ඔක්ටේන් 95 ලෙස ගෙන්වන පෙට්‍රල්, ඔක්ටේන් 90 ලෙස අගය බාල කර වෙළඳපොළ වෙත මුදා හරිනු ලැබුවේද;

(iii) එසේ නම්, එසේ කිරීමට සිදු වූ පෙට්‍රල් තොගය සැපයූ චීන සමාගමට යළිත් බොර තෙල් ගෙන්වීමට අවසර ලබා දී තිබීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ආයතන ඉන්ධන ආනයනය කිරීමේදී අක්‍රමිකතා සිදුකර ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම ආයතනවලට එරෙහිව මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5104/'14

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සිසුන් සඳහා 'සිසු සම්පත' නමින් රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එම රක්ෂණ ක්‍රමය සඳහා දායකත්වය ලබාගෙන සිටින පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2014 වර්ෂයේදී එම රක්ෂණ ක්‍රමය යටතේ සිසුන්ට ලබා දී ඇති ප්‍රතිලාභවල සමස්ත වටිනාකම කොපමණද;

(iv) 'සිසු සම්පත' රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇති රක්ෂණ සමාගමේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5349/'14

ගරු අනෝමා ගමගේ මහත්මිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ පවත්වාගෙන යන කුඩා ජල විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජල විදුලි බලාගාර තිබෙන දිස්ත්‍රික්කය, ස්ථානය, ඊට සම්බන්ධිත ජල මාර්ගය හා ඒවා මගින් ජාතික විදුලිබල පද්ධතියට එක්වන විදුලි ධාරිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය සභාගත කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කුඩා ජල විදුලි බලාගාර අතර රජය යටතේ ක්‍රියාත්මක වන බලාගාර තිබේද;

(ii) එසේ නම්, එවා කවරේද;

(iii) පෞද්ගලික අංශයේ කුඩා විදුලි බලාගාර ආරම්භ කිරීම සඳහා අනුමතිය ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙත කවරේද;

(iv) එම බලාගාර ඉදිකිරීම නිසා පරිසරයට සිදු වන බලපෑම පිළිබඳව පසු විපරමක් සිදු කරන්නේද;

(v) එසේ නම්, එය සිදු කරන ආකාරය කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5639/'14

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2014 මැයි මස 18 වැනි දින මාතර දී පවත්වනු ලැබූ රණවිරු උපහාර ජාතික උත්සවය සඳහා වැය කළ සමස්ත මුදල කොපමණද;

(ii) යුද්ධය හේතුවෙන් පූර්ණ හා අර්ධ ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ආබාධිත රණවිරුවන් වෙනුවෙන් නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේද;

(iv) එසේ නම්, මේ වන විට සාදා නිම කොට රණවිරුවන්ට භාර දෙන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(v) නිවාස ලබා දීමට අමතරව, ආබාධිත රණවිරුවන් වෙනුවෙන් වෙනත් සුබ සාධන කටයුතු ක්‍රියාත්මක වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?